# දෝෂාද කුලේ කුන්තා

සිහිනයක නැගී
පියඹන්න හිතයි
කුළුදුලේ පිපුණ පෙම් කුසුම අරන්
ලොව දෙනෙත් වසා
පුද දෙන්න හිතයි
දෝෂාද කුලේ කුන්තා....



සතර දෙසින් නැගී
පවුරු බිඳන්
ඉගිලෙන්න හිතයි
බයිහාර වනේ දසතා
මට නැද්ද වරම්
සිප ගන්න තරම්
ප්‍රේමයේ සුවඳ රැඳී ලිලී මලයි
දෝෂාද කුලේ කුන්තා.....

අඳුරු වළාකුළු ඈතට යාවී
රිදී ඉරක් වී හිරු පායාවී
බයිහාරයෙ මග වනය පුරා
අප හෙලූ කඳුලැල් වියැකී යාවී
සරස්වතී වැව් - වනස්පතී යායේ
දෝෂාද කුලේ කුන්තා....

**- සුනිල් උඩුකල -**

(ඉන්දීය, වංග ලේඛක, විභූතිභූෂණ බන්ධෝද්පාධ්‍යාය ලියූ
**"අරණකට පෙම් බැඳ"**
නවකතාව ඇසුරෙනි.)

පදරුත් මෙසේය.
- කුන්තා - දෝෂාද කුලය නමැති පහත් කුලයක උපන් ඉන්දීය කාන්තාවකි.
- බයිහාර වනය - මධ්‍ය ඉන්දියාවේ වනාන්තරයකි.
- සරස්වතී වැව - බයිහාර වනාන්තරයේ පිහිටි වැවකි.
(නම්, ගං ආදිය මනඃකල්පිත ඒවා විය හැක.)